# ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම්

එක් එක් පාඨමාලාව සඳහා ලියාපදිංචි වීමට අවශ්‍ය මූලික සුදුසුකම් පිළිබඳ සියලු විස්තර මතු දැක්වෙන අතර, අදාළ සුදුසුකම් සපුරා නොමැති කිසිම අපේක්ෂකයෙකු ලියාපදිංචි වීම සඳහා අයදුම් නොකළ යුතු ය.

1. ඒ ඒ විෂයයන් සඳහා සීමිත ශිෂ්‍ය සංඛ්‍යාවක් ලියාපදිංචි කර ගන්නා බැවින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස්පෙළ) පරීක්ෂණයේ දී ඉහළම ඉසෙඩ් අගය (Z-Score) ලබා ඇති ශිෂ්‍යයන්ට ප්‍රමුඛතාව ලබා දීමේ පදනම මත අපේක්ෂකයින් තෝරාගනු ලැබේ.

2. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මඟින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණයෙන් තෙවතාවක් තුළ, එක්වරක දී ම ගණිතය විෂය ධාරාවෙන් සංයුක්ත ගණිතය ඇතුළුව විෂයයන් 3ක් සමත් ව සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රයෙන් 30% කට නොඅඩු ලකුණු ප්‍රමාණයක් ලබා තිබීම.

   **සහ**

3. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) පරීක්ෂණයෙන් ඕනෑම විෂයයන් 3 ක් සඳහා සම්මාන සාමාර්ථ 3 ක් සහිතව ගණිතය ඇතුලු විෂයයන් 6 කින් සමත් වී තිබීම හෝ මූලික පිරිවෙන් අවසාන පරීක්ෂණයෙන් සම්මාන සාමාර්ථ 3 ක් සහිතව විෂයයන් 6 කින් සමත් වී තිබීම, අයදුම් කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.